## where is our ID? [Sam J] 19May19

### අපේ අනන්‍යතාවය කොතැනද?

බොහෝ දෙනෙක් තම අනන්‍යතාවය සමග කරදර වෙති. මා විශ්වාස කරන්නේ අපි කෙසේ සිටිය යුතුදැයි දෙවියන්වහන්සේ තැබූ අපේක්ෂාවෙන් අප ඉවතට හැරී, ඔබ මේ දේහ ලක්ෂණ හෙවත් පෞරුෂයන් තිබිය යුතුයැයි කියා අපට අණ කරන, මේ ලෝකයේ තෘෂ්ණාවේ දේවල් එනම් කාන්තාවන්ගේ සිරුරේ ප්‍රමාණය 8-10 විය යුතු අතර පුරුෂයන් අයෝමය "මචෝ" පෙනුමක් ඇතිව, උදරයේ පේශීන් 6 ක් පෙනෙන්නට ඇතිව සිටිය යුතුයැයි කියන මත අනුගමනය කරමින් සිටින නිසා එසේ සිදුවී ඇති බවයි. ඔබ කවුදැයි සිතනවාට එය වඩා බාහිර ශාරීරික පෙනුමක්, මෝස්තරයක් පමණක් වී තිබේ.

අපිත් එක්තරා ප්‍රමාණයකට මේ සමග හසුවී සිටින බව මා සිතනවා. එසේම අපි ප්‍රවේශම් නොවුනොත් අපේ අනන්‍යතාවයත් දෙවියන්වහන්සේට අප ගැන කියන්නට තිබෙන දෙයට වඩා මෝස්තර ලෝකය අනුව හැඩගැසෙනවා ඇත. ඔබ කවුද කියා මේ මෝස්තර ලෝකය කියන මතවාදයෙන් ඔබව ඉවත්කර, ඔබ කවුද කියා දෙවියන්වහන්සේ කියන තැනට ඔබව ගෙන ඒමට මට අවශ්‍යයි.

1. ඔබව දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් සහ සමානත්වයෙන් සාදා ඇත. (උත්පත්ති 1:26 තවද දෙවියන්වන්සේ අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ. ඔව්හු පොළොවේ ද අහසේ ද මුහුදේ ද සියලු ජීවීන් කෙරෙහි ආණ්ඩු කෙරෙත්වයි කීසේක.)

දෙවියන්වන්සේ උන්වන්සේගේ පෞද්ගලික අත ගැසීම අප මත තැබූසේක. උන්වන්සේ ස්වකීය හුස්ම ආදම් තුළ තැබූසේක. සියලුම මැවිල්ල තුළ මනුෂ්‍යයා සුවිශේෂී වේ. එකිනෙකා සමග සම්බන්ධ වන (මනස) සිතීම, හැඟීම් (දැනීම්) සහ කැමැත්ත (ක්‍රියාව) සහ දෙවියන්වන්සේ සමග සම්බන්ධවන ආත්මය ඇතුළත් වූ ශරීරයක් අපට තිබේ. දෙවියන්වහන්සේ ආත්මයක් බැවින් දෙවියන්වන්සේට සමානවන ලෙස අපව සාදා ඇත්තේ මාංසයෙන් සහ ලෙයින් නොවේ. ආදම්ගේ ශරීරය තුළින් ආදම් ජීවත් විය යුතුයැයි දෙවියන්වන්සේ අපේක්ෂා කළ ආකාරයටම ලෙඩරෝග හෝ වේදනාව හෝ දුක් විඳීමක් නැති මරණයට යටත්මක් නැති අංග සම්පූර්ණ ජීවිතය පෙනුනි. දෙවියන්වන්සේ සත්ව ලෝකයට වඩා වෙනස් ආකාරයෙන් අපව සෑදූසේක. දෙවියන්වහන්සේගේ ස්වරූපය නිසා දෙවියන්වන්සේ සමග සංනිවේදනය කිරීමේ හැකියාව අඩංගු පැත්ත පාවිච්චි කිරීමේ හැකියාව, සිතීමේ සහ හැඟීම් බරවීමේත් සදාචාරාත්මක සහ සමාජ මට්ටම් තබා ගැනීම් ගැන සිතීමේ හැකියාව මනුෂ්‍යයාට තිබේ. දෙවියන්වන්සේගේ බුද්ධිය සහ නිදහස පිළිබිඹු කිරීමක් වන කරුණු විමසා බැලීමේ සහ තෝරා ගැනීමේ හැකියාව අපට තිබේ. සදාචාරාත්මකව මනුෂ්‍යත්වය මවා ඇත්තේ ධාර්මිෂ්ඨකම සහ අංගසම්පූර්ණ නිර්දෝෂීභාවය ඇතිව දෙවියන්වන්සේගේ ශුද්ධකමෙහි පිළිබිඹු කිරීමක් ලෙසය. දෙවියන්වන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් අපටත් ශුද්ධව සිටින්නැයි 1 පේතෘස් අපට කියයි.

දිනෙන් දින සෝදා පාලුවට යන සදාචාරාත්මක තත්වයන් නිසා මනුෂ්‍යත්වයේ ලොකුම කොටස පීඩාවට පත්ව ඇති බව මා සිතමි. වසර 20කට පෙර ශුද්ධව සදාචාරාත්මකව තිබුණු දේවල් දැන් තවත් එසේ නොවේ. මනුෂ්‍යයන් සදාචාරාත්මක නොවන ආකාරයේ ලිංගික ක්‍රියාවල යෙදීම බහුලව කරන අතර කිසි කෙනෙක් ඒ ගැන නොසළකන බව පෙනේ. එය සාමාන්‍යය සම්මත දෙයක් ලෙස පිළිගන්නා තත්වයට පත්ව තිබේ. විවාහයට පෙර එකට ජීවත්වීම සහ ලිංගික සම්බන්ධතා පැවැත්වීම සාමාන්‍යය සම්මතයක් බවට පත්ව තිබේ. ඥාති දරුවන් සමග අනිසි ලෙස ලිංගික සම්බන්ධතා පැවැත්වීම, බහු විවාහයන් සහ සමලිංගික සේවනය වැනි දේවල් සාමාන්‍යය සම්මත දේවල් බවට පත් කරගෙන තිබේ. දේ දේවල් අනුව බලන විට දෙවියන්වන්සේ අපව මැවීමේදී අප සිටිය යුතුයැයි අදහස් කළ තත්වයෙන් කොතරම් ඈතට අප වැටී සිටිනවාද කියා අපට දැක ගත හැක.

මේ සියල්ල තුළින් මනුෂ්‍යයන් ඔවුන්ගේ අනන්‍යතාවය නැති කරගෙන තිබේ. මක්නිසාද සාතන් විසින් දෙවියන්වහන්සේගෙන් නොවන ව්‍යාජ දේවලට එම අනන්‍යතාවය විකෘති කර ඇත. අද අනන්‍යතාවය ලොකු කාරණයක් බවට පත්ව තිබේ. ඉතාමත් යෞවන දරුවන් ඔවුන්ගේ ලිංගිකත්වය ගැන විමසීමට සහ ගවේශනය කිරීමටත් ඔවුන්ට තමාට තිබෙන්නේ නිවැරදි ලිංගය නොවේ කියා හැඟෙන්නේ නම් එය වෙනස් කරගැනීමටත් දිරි ගන්වා ඇත. මනුෂ්‍යත්වය සාදන විට දෙවියන්වන්සේ වරදක් කළායැයි මා සිතන්නේ නැහැ. ලිංගිකත්වයට

පමණක් මුල්තැන දෙන මනුෂ්‍යයෙක් සිටිනවා කියා මම සිතන්නේ නැහැ. දෙවියන්වන්සේ ලිංගිකත්වයේ අනන්‍යතාවයක් නැතුව මනුෂ්‍යයා සහ කාන්තාව අඳුනා ගැනීමට යහපත් ලෙස අදහස් කළ දෙය යක්ෂයා සොරකම් කරගෙන තිබෙන ආකාරය ඔබට දැකිය හැකියි.

අපි මේ දේවල්වලට හසු නොවී සිටිමු. එසේම අපේ දරුවන්ට, ඔවුන් දෙවියන්වහන්සේ තුළ කවුද කියාත් උන්වහන්සේ ඔවුන් සාදන විට කිසිම වරදක් නැතුව අංගසම්පූර්ණ ලෙස සාදා ඇති බවත් උගන්වමු. පුරුෂයන් පිරිමින් ලෙසත් කාන්තාවන් කාන්තාවන් ලෙසත් අපි අපිම වීම ගැන අගය කොට සළකමු.

ඔබටම මෙසේ කියාගන්න "මම දෙවියන්වන්සේගේ ස්වරූපයෙන් සාදනු ලැබුවෙමි, මාගේ ස්ත්‍රී/පුරුෂ භාවය (ලිංගය) ගැන හෝ හැඩ රුව ගැන මට අවුලක් නැහැ. මගේ අනන්‍යතාවය ගැන මට අවුලක් නැහැ. දෙවියන්වන්සේ යහපත් කී සියල්ල විනාශකරන්ට වෑයම් කරන සතුරාට මම ඉඩ දෙන්නේ නැහැ."

උත්පත්ති 1:31 දෙවියන්වන්සේ මැවූ සියල්ල යහපත් බව දුටුසේක. ඔබ වැරදුණු අනන්‍යතාවයක් (හැඳුණුමක්) ඇති කෙනෙක් නොවේ. සමාජීය ලෙස මනුෂ්‍යවර්ගයා සාදා ඇත්තේ දෙවියන්වන්සේ සමග සහ එකිනෙකා සමග සහභාගිකම ඇතිව සිටීමටයි. එය දෙවියන්වන්සේගේ ස්වභාවය සහ උන්වන්සේගේ ප්‍රේමය පිළිබිඹු කරන ආකාරයකි. මිනිසා තනිව සිටීම හොඳ නැති බව සිතා දෙවියන්වන්සේ ඔහුගේ සහභාගිකම උදෙසා සහකාරියක් වීමට ස්ත්‍රිය සෑදූසේක (උත්පත්ති 2:18). යම්කෙනෙක් විවාහ වෙන විට, මිත්‍රකමක් ඇතිකර ගන්නා විට, දරුවෙකු සිපගන්නා විට හෝ සභාවකට යන විට යනාදී සෑම වේලාවකදීම ඔහු හෝ ඇය පෙන්නුම් කරන්නේ අපි සහභාගිකම උදෙසා දෙවියන්වන්සේගේ ස්වරූපයට සමානව සාදා ඇති බවයි.

දෙවියන්වන්සේගේ ස්වරූපයට සමානව සාදනු ලැබීමේ එක් කොටසක් නම් ආදම්ට නිදහසේ තෝරාගැනීමට හැකියාව තිබීමයි. ඔවුන්ට ධර්මිෂ්ඨ ස්වභාවයක් දී තිබුණත් ආදම් සහ ඒව ඔවුන්ගේ මැවුම්කාරයාට එරෙහිව කැරලි ගසන පිණිස නරක තෝරාගැනීමක් කළෝය. එසේ කිරීමෙන්, ඔවුන් තුළ තිබුණු දෙවියන්වන්සේගේ ස්වරූපය ඔවුන් පලුදු කරගත් අතර ඔවුන්ගෙන් පැවතෙන්නන්ට එය උරුමකර දෙන ලදී (රෝම 5:12). අද, තවමත් අපි දෙවියන්වන්සේගේ ස්වරූපය දරන්නෙමු (යාකොබ් 3:9). එසේම අප පාපයේ කැලැල් ද දරන්නෙමු. මානසිකව, සදාචාරාත්මකව, සමාජීයව සහ ශාරීරිකව පාපයේ බලපෑම් පෙන්නුම් කරන්නෙමුව.

2 කොරින්ති 1:21-22 ඉදින් නුඹලා සමග අප ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්ථිර කරන්නෙත් අප ආලේප කළෙත් දෙවියන්වන්සේය. 22 උන්වන්සේ අප මුද්‍රාකොට අපේ සිත් තුළ ආත්මයාණන්වහන්සේ නමැති අත්තිකාරම අපට දුන්සේක.

යහපත් ආරංචිය නම් දෙවියන්වන්සේ පුද්ගලයෙක් මුදවා ගන්නා විට උන්වහන්සේ, ඔහු/ඇය තුළ මුලින් තිබුණු දෙවියන්වන්සේගේ ස්වරූපය "අලුත් කෙනෙක්, සැබෑ ධර්මිෂ්ඨ කමෙන් සහ ශුද්ධකමෙන් දෙවියන්වන්සේ වාගේ වෙන පිණිස නැවත ගොඩනැංවීමට පටන් ගන්නාසේක" (එපීස 4:24). ඒ මිදීම අපට ඇත්තේ දෙවියන්වන්සේගේ අනුග්‍රහයෙන්, අපව දෙවියන්වහන්සේගෙන් වෙන්කරන පාපයෙන් අපව ගලවන, අපගේ ගැලවුම් කරුවානන් ලෙස ඇදහිල්ලෙන් යේසුස් ක්‍රිස්තුස්වන්සේ කෙරෙහි අදහා ගැනීමෙන් පමණි (එපීස 2:8-9). ක්‍රිස්තුස්වන්සේ තුළින් අප දෙවියන්වහන්සේ වාගේ වෙන පිණිස අලුත් මැවිල්ලක් සේ සාදනු ලබන්නෙමු (2 කොරින්ති 5:17).